# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2366/40 - 2024 ජනවාරි මස 12 වැනි සිකුරාදා - 2024.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: KHDS/LND/03/ACQ/OTHER/18.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2019/S/223.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම අත්කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ පන්නිල් පත්තුව සුළු කොට්ඨාසයේ, ඇන්දාන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 620568, කලාප අංක 1, පත්‍ර අංක 1හි සහ 2023.10.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0405ක් පමණ වන ඉඩම් කොටස.

**01. කැබලි අංක 01**

ඉඩමේ නම : ඇන්දානවත්ත; විස්තරය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, අවුරුදු 15-20ක් පැරණි තේක්ක ගසක් සහිත මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: කහවත්ත වැවිලි සමාගම සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0405

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 මාර්තු මස 25 වැනි දින පෙ.ව. 10.00ට කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 මාර්තු මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

සංජීවනී කන්ධම්බි,
ප්‍රාදේශීය ලේකම්,
කහවත්ත.

2024 ජනවාරි මස 10 වැනි දින,
කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01-0106

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : කැල/7/ඉඅ/3/232.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඊරියවැටිය ගමේ පිහිටි ගම්පහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අංක කැ.සි. 511614 කලාප අංක 03 පත්‍ර අංක 01 සහ 2023.10.30 දිනැති මූලික පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0945 (පර්චස් 37.4) ක් වූ ඉඩම,

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : වැවහේන; වර්තමාන ඉඩම් පරිහරණය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිලි පහක් ඇත; හිමිකම් කියන අය : විහාරාධිපති, පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් විහාරය; ප්‍රමාණය: හෙක්. 0.0945 (පර්චස් 37.4)

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනා තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 මාර්තු මස 15 වැනි දින පෙ. ව. 9.30ට කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2024 මාර්තු මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම්/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් 2ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු හා අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.

ඒ. ඒ. ඩී. සී. නදීෂානි අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කැලණිය.

2023 නොවැම්බර් මස 27 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කැලණිය.

EOG 01-0107